**නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - 2021**

---------------------------------------------------------------------------------------------------

නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය අතර 2017 ජුලි 07 දින එලඹි අංක එස්එල්-පී 116 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ III ව්‍යාස්ථාවේ 4 ඡේදයේ 6 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 04 ක පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මගින් මිනිසුන්ගේ ජීවන තත්ත්වයන් ඉහල නැංවීම හා ජීවනෝපාය සංවර්ධනය කිරීම වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 20,622 කට සමාන ජපන් යෙන් මිලියන 15,410 ක් වන අතර ඇස්තමේන්තුගත මුළු පිරිවැයෙන් රු.මිලියන 17,185කට සමාන ජපන් යෙන් මිලියන 12,957 ක් මූල්‍යායනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,437කට සමාන ජපන් යෙන් මිලියන 2,452ක් මූල්‍යායනය කිරීමට ශ්‍රී ලංකා රජය එකග වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජුලි 07 දින ආරම්භ කර තිබුණු අතර 2024 ජුලි 07 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 මතය

------

ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.1 නීති,රීති සහ රෙගුලාසි සමග අනුකූල නොවීම**

---

| නීති,රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | වාහන 10ක ඉන්ධන පරිභෝජනය පිළිබඳව 2019 ඔක්තෝබර් පරීක්ෂා කිරීමෙන් පසුව 2021 දෙසැම්බර් 31 දක්වා පරීක්ෂා කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | ඉන්ධන පරිභෝජනය සඳහා නිසි පාලනයක් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

**3.1.1 සැලසුම්කරණ සහ අධීක්ෂණ උපදේශකවරුන්ගේ කාර්යසාධනය**

| | විගණන ගැටලු | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | පානීය ජලය සඳහා උපදේශන සමාගම සමඟ අත්සන් කරන ලද ගිවිසුම අනුව කාණ්ඩ 01 යටතේ උප ව්‍යාපෘති 25ක සහ කාණ්ඩ 02 යටතේ උප ව්‍යාපෘති 14ක ප්‍රසම්පාදනයන් පිළිවෙලින් 2020 ඔක්තෝබර් සහ 2021 අප්‍රේල් අවසාන වනවිට නිමකළ යුතුව පැවතුණි. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දක්වා කාණ්ඩ අංක 01හි උප ව්‍යාපෘති 06ක සහ කාණ්ඩ 02 යටතේ උප ව්‍යාපෘති 11ක ප්‍රසම්පාදනයන් නිමකර තිබුණි. | ගිවිසුමේ ඇතුළත් වැඩ සැලැස්ම මූලික අධ්‍යානයක් සිදුකිරීමෙන් පමණක් උපදේශන සමාගම විසින් පිළියෙල කර තිබුණි. කෙසේවෙතත්, ප්‍රායෝගික තත්ත්වයන් මත මූලික වැඩ සැලැස්ම වෙනස්කර තිබුණි. එමනිසා ප්‍රමාදයන් වාර්තාකර නොතිබුණි. | අනුමත වැඩ සැලැස්ම විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.<br><br>උපදේශන කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය.<br><br>ගෙවීම් සිදු කිරීමට පෙර මාසික කළ වැඩ වාර්තා ලබා ගැනීමේ ක්‍රමයක් අනුගමනය කළ යුතුය. |
| (ආ) | ග්‍රාමීය මාර්ග සහ වාරිමාර්ග සඳහා උපදේශන සමාගම සමඟ අත්සන් කරන ලද ගිවිසුම අනුව අදියර 01 යටතේ සියලුම උප ව්‍යාපෘතිවල ප්‍රසම්පාදනයන් 2020 ජූලි අවසාන වීමට පෙර නිම කළ යුතුවේ. කෙසේවෙතත්, 2022 දෙසැම්බර් 31 දක්වා අදියර 01 යටතේ උප ව්‍යාපෘති 08ක ප්‍රසම්පාදනය කර නොතිබුණි. එමනිසා, ඉලක්ක අත්පත් කරගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | අදියර 02 යටතේ- ග්‍රාමීය මාර්ග සහ වාරිමාර්ග උප ව්‍යාපෘති 105ක ප්‍රසම්පාදනයන් 2021 අප්‍රේල් මස අවසන් වන විට නිම කළ යුතු වුවද 2021 දෙසැම්බර් 31 දිනට උප ව්‍යාපෘති 53ක් පමණක් ප්‍රසම්පාදනය කර තිබුණි. එමනිසා අදියර 02හි ප්‍රගතිය සියයට 50ක් පමණක් විය. | -එම- | -එම- |
| (ඈ) | අදියර 03 යටතේ- ග්‍රාමීය මාර්ග සහ වාරිමාර්ග උප ව්‍යාපෘති 96ක ලංසු ලියවිලි 2021 අගෝස්තු අවසාන වන විට ඉදිරිපත් කළ යුතු වුවද 2021 දෙසැම්බර් 31 දිනට උප ව්‍යාපෘති 02ක පමණක් ඉදිරිපත් කර තිබුණි. එමනිසා අදියර 03හි ප්‍රගතිය සියයට 02ක් පමණ විය. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | උපදේශන සමාගම් දෙකෙහිම ප්‍රගතිය දුර්වල වුවද, ග්‍රාමීය මාර්ග සහ වාරිමාර්ග උපදේශන සමාගම වෙත රු.මිලියන 754.8ක් ගෙවා තිබුණි. තවද, පානීය ජල උප ව්‍යාපෘතිවලින් සියයට 46.6ක් අවලංගු කර තිබුණද පානීය ජලය උපදේශන සමාගම වෙත රු.මිලියන 368.8ක් හෙවත් මුළු ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 60ක් ගෙවා තිබුණි. | සංශෝධිත වැඩ සැලැස්ම අනුව අපේක්ෂිත භෞතික ප්‍රගතිය සියයට 60ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට සත්‍ය ප්‍රගතිය සියයට 40ක් විය. කරන ලද වැඩ අනුව ගෙවීම් සිදුකර ඇත. | -එම- |

## 3.1.2 උප ව්‍යාපෘතිවල කාර්යසාධනය

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති සංදේශයට අමුණා ඇති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව, මෙම ව්‍යාපෘතිය යටතේ උප ව්‍යාපෘති 418ක ඉදිකිරීම් කටයුතු නිමකළ යුතුව ඇත. කෙසේවෙතත්, විවිධ හේතූන් නිසා 2021 දෙසැම්බර් 31 දිනට පානීය ජල සැපයුමේ ව්‍යාපෘති 34ක් ඉදිකිරීමේ කටයුතු, ග්‍රාමීය මාර්ග උප ව්‍යාපෘති 21ක් සහ වාරි ජල සැපයුම් ව්‍යාපෘති 14ක් (එකතුව 79) ඉවත්කර තිබුණි. ආරම්භක වැඩ සැලැස්ම අනුව අදියර 01හි ග්‍රාමීය මාර්ග සහ වාරිමාර්ග උප ව්‍යාපෘති 109ක ඉදිකිරීම් 2021 නොවැම්බර් අවසාන වන වීමට පෙර නිමකළ යුතුවේ. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් අවසාන වන විට උප ව්‍යාපෘති 21ක් පමණක් නිමකර තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ අනෙකුත් නොවැළැක්විය හැකි සිද්ධීන් හේතුවෙන් වැඩ සැලැස්ම වෙනස් කර තිබුණි. | ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

## 3.2 මතභේදයට තුඩුදෙන ගැටලු

| | විගණන ගැටලු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙම ව්‍යාපෘතියේ උපදේශන සමාගම් දෙකෙහි ප්‍රධාන විශේෂඥ සහ ප්‍රධාන නොවන විශේෂඥ තනතුරුවල පුරප්පාඩු කඩිනමින් පුරවා නොතිබුණු අතර සමහර පුරප්පාඩු තනතුරු පිරවීමට දින 34 සිට මාස 32ක් දක්වා ගෙන තිබුණි. | උපදේශන සමාගමට අනුයුක්ත ප්‍රධාන විශේෂඥවරු කලින් කලට ඉවත්වී ඇති අතර සදහන් ක්‍රමවේදවලට අනුව අනුප්‍රාප්තිකයන් බඳවා ගත්තද එය දින 30සිට දින 60දක්වා ගෙන ඇත. ප්‍රධාන කාර්යාලයේ සහාය ඇතිව ප්‍රමිතියේ වෙනසක් නොමැතිව කටයුතු පවත්වාගෙන යාමට ක්‍රමයක් ක්‍රියාත්මක කරමින් පවතී. | ගිවිසුමේ සඳහන් පරිදි පුරප්පාඩු තනතුරු පිරවීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | වැටුප් ගැලපීම් සාවද්‍ය ලෙස සිදුකර ඇති අතර මාස 09ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සියළුම | තවදුරටත් විමර්ශනය සදහා කමිටුවක් පත්කර ඇත. | වැඩිපුර ගෙවන ලද මුදල අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විශේෂඥවරුන් වෙත වැටුප් වැඩිවීම් ගෙවීම හේතුවෙන් ග්‍රාමීය මාර්ග හා වාරිමාර්ග උපදේශක සමාගම් එළඹි ගිවිසුමෙහි 6.2(ඇ) කොන්දේසිය සැලකීමකින් තොරව 2021 සැප්තැම්බර් දක්වා උපදේශන සමාගම් වෙත රු.මිලියන 3.8ක අමතර ගෙවීමක් සිදුකර ඇත. | | |
| (ඇ) | මැනීම, සැලසුම්කිරීම, ප්‍රමාණය සහ පිරිවැය ඇස්තමේන්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම ඇතුලුව වැඩබිම් සමීක්ෂණය පදනම් කර ගනිමින් උපදේශක විස්තරාත්මක සැලැස්ම සකස් කළ යුතුය. කෙසේවෙතත්, කොන්ත්‍රාත් පැකේජ 37 සඳහා සැකසීම, හරස්කඩ සමීක්ෂණය සහ ඇඳීම සඳහා රු.මිලියන 31.4ක මුදලක් ගෙවීමට එකඟවී තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට සඳහන් කරන ලද කටයුතු සඳහා එකතුව රු.මිලියන 19.6ක් ගෙවා තිබුණි. ඒ අනුව එකම සේවාව සැපයීම සඳහා පාර්ශවයන් දෙදෙනෙකු වෙත ගෙවීම් කර තිබුණි. | උපදේශක සිය මූල්‍ය යෝජනාවේ මාර්ග සැලසුම් කිරීම සඳහා කිසිදු විමර්ශනයක් කිරීමට පිරිවැය ඇතුළත් කර නොතිබුණි. විමර්ශනයන් සහ දත්ත එකතුකිරීම වැනි කටයුතු සිවිල් වැඩ කොන්ත්‍රාත්වලට ඇතුළත් කළ යුතු බව යෝජනා විය. | උපදේකශක විසින් එකඟවූ කටයුතු සිදුකළ යුතු අතර ඒ සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු නොවේ. |
| (ඇ) | එකවර කරන වියදම් ලෙස රක්ෂණ වියදම් සඳහා කොන්ත්‍රාත්කරු වෙත රු.මිලියන 9.48ක වැඩිපුර ගෙවීමක් සිදුකර ඇත. | ලංසු ඉදිරිපත් කිරීමේදී රක්ෂණය ප්‍රතිපාදනය එකවර ගෙවීමක් ලෙස සලකා ඇත. | වැඩිපුර ගෙවන ලද මුදල අයකරගත යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණයට අදාල ගැටලු**

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතියට කළමනාකරණ සහකාරවරයෙකු ලෙස බඳවා ගන්නා ලද නිලධාරියෙකු 2017 පත්වීම දින සිට අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ව්‍යාපෘති) වෙත පෞද්ගලික සහකාර ලෙස අනුයුක්ත කර තිබේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ඉහත සඳහන් කළමනාකාරණ සහකාර වෙත එකතුව රු.මිලියන 1.5ක් ගෙවා තිබුණි. | ජැයිකා (JICA) ව්‍යාපෘතිය සම්බන්ධ අත්දැකීම් සහිත අමාත්‍යාංශයේ සේවය කරන නිලධාරියෙකු කළමනාකාර සහකරුවකු ලෙස ව්‍යාපෘතියට අනුයුක්ත කර ඇත. | පත්වීම අවසන් කිරීමට ව්‍යාපෘතිය පියවර ගත යුතුය. |